# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 2171635 — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1072 /2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 29/06/2024 පැය 0525

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කතෘ / ප්‍රවෘත්ති කතෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය.**

2024.06.28 වන දින රාත්‍රී කාලයේදී දෙහිවල පොලිස් වසමේ නැදිමාල ප්‍රදේශයේදී බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 20 මිලිග්‍රෑම් 60 ක් සන්තකයේ තබාගෙන සිටි** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වන ගල්කිස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - එගොඩඋයන පොලිස් ස්ථානය.**

2024.06.28 වන දින උදෑසන කාලයේදී එගොඩඋයන පොලිස් වසමේ මෝදර ප්‍රදේශයේදී එගොඩඋයන පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 680 ක් සන්තකයේ තබාගෙන සිටි** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන මොරටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

එගොඩඋයන පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - හෝමාගම පොලිස් ස්ථානය.**

2024.06.28 වන දින දහවල් කාලයේ හෝමාගම පොලිස් වසමේ ජයමාවත ප්‍රදේශයේදී හෝමාගම පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 350 ක් සන්තකයේ තබාගෙන යතුරු පැදියකින් ගමන් කරමින් සිටි** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46 ක් වන හෝමාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරුගෙන් කරන ලද ප්‍රශ්න කිරීමේදී 2024.06.27 වන දින බණ්ඩාරගම පොලිස් වසමේ සිදුකල යතුරුපැදි සොරකමක් හා 2024.06.28 වන දින මහරගම පොලිස් වසමේ සිදුකල කාන්තා අත් බෑගයක් කොල්ලකෑමේ අපරාධයට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු බවට අනාවරණය වී ඇත. සැකකරු ගමන් කල යතුරු පැදිය එම සොරකම් කරන ලද යතුරු පැදිය බවට අනාවරණය වී ඇත. හෝමාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

2024.06.28 වන දින අළුයම් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ ගල්කිස්ස දුම්රිය ස්ථානය අසලදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 06 ක් සන්තකයේ තබාගෙන සිටි** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වන රත්මලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - හෝමාගම පොලිස් ස්ථානය.**

2024.06.28 වන දින සවස් කාලයේ හෝමාගම පොලිස් වසමේ ටවුන් පාර ප්‍රදේශයේදී හෝමාගම පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 101 ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 36 හා 45 වයස්වල පසුවන හෝමාගම ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

හෝමාගම පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. මත්කරල් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මන්නාරම කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.06.28 වන දින රාත්‍රී කාලයේ මහව පොලිස් වසමේ රෝහල් හන්දියේදී ප්‍රදේශයේදී මන්නාරම කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මත් කරල් 3700 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු** අත්අඩංගුවට ගෙන මහව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වන අඹන්පොල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මහව පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. පාසැල් ළමුන් අසාද්මිකතාවයක් හේතුවෙන් රෝහල් ගත කිරීමක් - මඩු පොලිස් වසම.**

2024.06.28 වන දින දහවල් කාලයේ මඩු පොලිස් වසමේ තච්චනාමරදමඩු ප්‍රදේශයේදී ළමුන් කිහිප දෙනෙකු එඬරු ඇට ආහාරයට ගැනීමෙන් අසාද්මිකතාවයක් ඇති වී ඇති බවට මඩු පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත. මේ හේතුවෙන් පිරිමි දරුවෙකු සහ දැරියන් 07 දෙනෙකු මන්නාරම රෝහලට ඇතුලත් කර ඇත.

**තුවාල ලැබූ දරුවන් වයස අවුරුදු 09 ක් වන මඩු ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මඩු පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08. මාරක රිය අනතුරක් - හලාවත පොලිස් වසම.**

2024.06.28 වන දින රාත්‍රී කාලයේදී හලාවත පොලිස් වසමේ හලාවත කුරුණෑගල මාර්ගයේ විලත්තව ප්‍රදේශයේදී හලාවත දෙස සිට කුරුණෑගල දෙසට ධාවනය කල ලොරි රථයක් මාර්ග අයිනේ ගමන් කරමින් සිටි පදික පුද්ගලයෙකු ගැටී මාර්ගයෙන් ඉවතට පැන විදුලි රැහැන් කණුවක ද ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික පුද්ගලයා හා ලොරි රථ රියදුරු හලාවත රෝහලට ඇතුලත් කිරීමේදී පදිකයා මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 60 ක් වන පුංචි විලත්තව, මුගුණුවටවන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය හලාවත රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. හලාවත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**09. මාරක රිය අනතුරක් - ගම්පහ පොලිස් වසම.**

2024.06.28 වන දින සවස් කාලයේදී ගම්පහ පොලිස් වසමේ උඩුගම්පල දොලාගත මාර්ගයේ දොලාගත ප්‍රදේශයේදී උඩුගම්පල දෙස සිට දොලාගත දෙසට ධාවනය කල යතුරු පැදියක් ඉදිරියෙන් පැමිණි ලොරි රථයක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරු පැදිකරු සහ ලොරි රථ රියදුරු ගම්පහ රෝහලට ඇතුලත් කිරීමේදී යතුරු පැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 33 ක් වන කටුවාපිටිය, මීගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ගම්පහ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ගම්පහ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**